ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 52/ News/ 2013

ක්‍රි. ව. 2013 මැයි 20 සඳුදා
05 වෙළුම - 28 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00

# ළමා ප්‍රදීපය



## ළමා ජන ගී හා ළමා ක්‍රීඩා

කොපර කොපර පිපිඤ්ඤා....
පස්ස බැලුවොත් දෙසඤ්ඤා....

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# ළමා ලෝකයේ සුරතල් අත්දැකීම්

## ආදරණීය දුවේ පුතේ...

ගිය සතිය තුළින් අපි කතා කළ මේ මාතෘකාවම මේ සතිය තුළත් කථා කරන්න යනවා. ඔබේ පුංචි ලෝකයේ සුරතල් අත්දැකීම් හා සම්බන්ධ වී තිබෙන ගායනා, ජන කවි, ක්‍රීඩා ආදිය පිළිබඳව නැවත ආවර්ජනය කරලා ඔබේ ලෝකය තුළ ඒ අත්දැකීම් විඳගන්නට සැලැස්වීමටත්, වැඩිහිටි අයට ඒ අයගේ කුඩා අවධිය නැවත මතකයට නංවා ගන්නටත් ළමා ප්‍රදීපය සැමදම හොඳ අත්වැලක් සපයන්න සූදානම්. විශේෂයෙන්ම කතෝලික ආධ්‍යාත්මය තුළ ගම්බඳ පරිසරයේ මීසම් අත්දැකීම පුංචි ඔබ හොඳ කාරවම විඳිනවා.

අපේ හෙළ සංස්කෘතියේ බොහෝ තැන් විචිත්‍ර කරන්නට හෙළ කතෝලික ආගමික ආභාෂයත් හොඳටම පිටිවහලක් වී තිබෙනවා. දැන් කතෝලික පාසල් වල නැටුම් කණ්ඩායම් වෙනුවෙන් වෙස් බැඳීම් සඳහා වෙනම යාච්ඤා මෙහෙයක් තිබෙනවා. ඔබේ පාසල තුළ තිබෙන නැටුම් කණ්ඩායම් , ඒ වගේම සාහිත්‍ය උළෙල ආරම්භයේදී ගයන්නට හා ගෞරව දක්වන්නට දේව මාතාවන් සිංහාසනාරූඪ කරවූ අභිනන්දන ගීතිකාවක් තිබෙනවා. ඉතිං ඔබ මේ ගැනත් අවධානයෙන් හා දැනුවත් කමින් සිටිය යුතුයි.

හොඳයි දැන් අපි ගෙවුනු සතියේ ළමා ප්‍රදීපය තුළින් මතක් කළ ඒ මතකය නැවත අලුත් කර ගනිමු.

ආදර දුවේ පුතේ, ''අතුරු මිතුරු'' ක්‍රීඩාව ගැන නම් පුංචි ඔබ හොඳටෝම දන්නවා. ළමුන් වටේට වාඩි වෙලා ඉන්න කොට අත්ල යටට සිටින සේ දැත් බිම තබාගත් විට නායකයෙක්ව තෝරනවා. ඔහු එක් අතක් පමණක් බිම තබාගෙන අනෙක් අයගේ අල්ලට තට්ටු කරමින් මෙහෙම කියනවා.

අතුරු මිතුරු දඹදිවතුරු රාජ කපුරු සෙට්ටියෝ
වරා ගහක් දුටින් බොලන් වරා ගහට ගොහින් බොලන්
පුහු කලටිය නෙලං බොලං ඇස්ස සිඟා කාපු වෙද
ඇති වෙළඳම් කරපු වෙද වෙලබඩ තිබූ අගුල කපා
රන් තැටියේ පුදා තියා
කුකුල කපල වැට මුල්ලේ
කිකිළි කපල දොර මුල්ලේ
කෙහෙල් කැනක් ගෙයි මුල්ලේ
කැවුම් කදක් දොර මුල්ලේ
උස් කොල්ලෝ පේලියයි
මිටි කෙල්ලෝ පේලියයි
උස් දරමිටි පේලියයි
මාමලාට නැන්දලාට
බෑනලාට ලේලිලයි
අක්කලාට අයියලයි නංගිලාට මල්ලිලයි
උසි කපුටා උසී
අලුත ගෙනා මනමාලී හාල් පතක් ගරාලා
බටු කොරහක් කපාලා ඉහළ ගෙටත් බෙදාලා
පහළ ගෙටත් බෙදාලා
ළිපේ තිබුණු මී කිරි මුට්ටි
හතෙන් එකක් ගොඩ ගනියෝ
ගොඩ ගනියෝ හෙට්ටියෝ (හෙළ ගොස)

බලන්න දුවේ, පුතේ , මේ ජනකවියෙන් අපේ පවුල් ව්‍යුහයේ ස්වභාවය ගැන කෙතරම් ලස්සන පිංතූරයක් ගෙන හැරදක්වනවද කියලා ා. ඒ විතරක් නොවෙයි අපේ පොදු ආහාර රටාව ගැනත් හොඳ අවබෝධයක් ගෙන හැර දක්වනවා. මේ ළමා ජන කවි භාවිතයෙන් බොහෝ විට ඉස්මතු වන්නේ ආත්මාර්ථය සම්පූර්ණයෙන්ම බැහැර කරවන අවකාශයක් තුළ හැඟීමක්මයි. අනිත් කරුණ තමයි, එදිනෙද ව්‍යවහාර වන පද අතරින් අපූරුවට ගලපා ගත් පද පේලි අමුණා කරන ඉදිරිපත් කිරීමත් හරිම සුන්දරයි.

කුඩා ළමුන් අත්වැල් බැඳගෙන වටේට කැරකෙමින් ක්‍රීඩා කරන අවස්ථාවේ ගැයෙන මේ කවි පදවැල් දිහා බලන්න.

කිනි කිනි බෝලේ රැලිරැලි මාලේ
මේ ළමයා කොහෙන්දෝ
කැකිරි කැලෙන් ගෙනාවේ
දඩිං බිඩිං ඩොස්

අවසානයේ දී ' දඩිං බිඩිං දොස්'' එකවර ඉඳගනු ලබනවා. නැවතත් නැගිට එම කවි ගායනා කරමින් ක්‍රීඩාවේ නිරත වෙනු ලබයි. දරුවන් සහ මව්පියන් අතර ඇති මහත්වූ සෙනෙහස ජනකවියා අලංකාර කරන්නෙත් මෙහෙමයි.

ඉනට පලා නෙළා ගෙනේ
බරටම දර කඩා ගෙනේ
අතට වෙරළු ඇහිඳ ගෙනේ
එයි අම්මා විගසකිනේ

අප්පා හේනට යනවා
ඉරිඟු කඩාගෙන එනවා
ලිපේ දමා පුච්චනවා
ඇට ගලවා මට දෙනවා

දරු නැළවිල්ලත් බොහෝ විට ශබ්ද ගුණය තුළින් යම් ලයාන්විත බවක් ළදරු මනසට ඇතුළු කරනවා. එදිනෙද ජීවිතයේ අත්දැකීම් එක්ක දරුවන් සමීප කරවමින් පරිසරයට ඔවුන්ව හිතකාමි කරනවා. අපි මේ ගැන තවත් කථා කරමු.

**ඔබට ජේසු පිහිටයි.**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# දිරිය දියණියගේ කිතුනු දිවි සාක්ෂි දැරීම

දුලාංජලී දුවගෙන් දුවාලට - පුතාලට පමණක් නොවේ ලොවටම ලබා දෙන ආධ්‍යාත්මික හා සමාජීය දැක්ම කියා නිම කළ නොහැක. සමාජයේ බොහෝ දෙනා, දැස් නොපෙනෙන , කතා කිරීමට නොහැකි, කන් නොඇසෙන ඇවිදීමට බැරි අය දකින විට ඇඟිල්ල දිගුකරන්නේ දෙවියන් වහන්සේගේ මැවීම පිලිබඳ අසාධාරණත්වය වෙතයි. උන්වහන්සේ අභියෝගයට ලක් කිරීමටයි. නමුත් මේ දුලාංජලී ආරියතිලක නමැති දිරිය දියණිය ඒ සැමට සාධාරණ පිළිතුරක් වගේම මැවීමේ ආශ්චර්යන්හී සැඟවුණ මහිමය තම ජීවිත ගමන තුළින් ලොවටම පසක් කර දී ඇත.

මිනිසාට අයත් බාහිර අවයවවල අඩුපාඩු කොපමණ තිබුණත් පූර්ණ ජීවිතයක් ගත කිරීමට - සතුටින් දිවි ගෙවන්නට එය අවශ්‍ය සාධකයක් නොවන වගත් වඩාත් වැදගත් වන්නේ ශරීරයේ බාහිරය නොව තම ඇතුලාන්ත ජීවිතය හා අපගේ සිතැඟි බවත් මෙහිදි අප තේරුම් ගතයුතු වනවා.

"මට ලැප්ටොප් එකක් නෑ" - "බයිසිකලයක් නෑ" ,"අලුත් ඇඳුම් නෑ" යනාදී වශයෙන් කියා දුක්වන දරුවෝ අප අතර අද අනන්තවත් ඉන්නවා. නමුත් දුවේ පුතේ, ඔබ මේ සොයුරිය ගැන එහෙම නැත්නම් "මිරිවැඩි සඟළක් ඉල්ලා ඇඬුවෙමි පා යුගනැති....." කියන නන්ද මාලිනි නැන්දගේ ගීතයේ පණිවිඩය ගැන හිතුවාද? අපිට අරවා නෑ - මෙව්වා නෑ කියලා කරන්ඩ බැරි දේකුත් නැත්තෙත් නැහැ නේද?. යමක් කරන්ඩ හිත තියනවා නම් ආත්ම විශ්වාසයකුත් ඇත්නම් - කැපවීමකුත් තියනවානම් ධෛර්යවන්ත නම් "නොකළ හැක්කක් නොමැත" යන උතුම් පණිවිඩය නොවෙයිද මේ දුලාංජලි සහෝදරිය ඔබට නොකියා කියන්නේ?.

නොයෙකුත් ශාරීරික අඩුපාඩු - අපහසුතා නිසා සමාජයට මුහුණ නොදෙන - සමාජයෙන් කොන්වී මුළු ගැන්වෙන - ඉදිරිපත් නොවන ඉදිරියට නොඑන දූ පුතුන් හට මේ දුලාංජලී සොයුරියගෙන් ඉගෙනගත හැකි පාඩම් අපමණයි. තම හැකියාවන් තමන් සතු තලෙන්තු හකුලාගෙන පසුබටවන - ඉදිරිපත් නොකරන එවන් දූ දරුවන්ට තම ජීවිත අභියෝගයන්ට අභියෝගාත්මකව මුහුණ දී ඉදිරියට යෑමේ ශක්තියක් - නිශ්චිත අරමුණක් ඉලක්කයක් කරා අධිෂ්ඨානශීලීව යාමේ ගුණයයි ඇය මතුකරන්නේ

එලෙසින්ම පොදුවේ අනෙකුත් සමස්ත දූ පුතුන් තම තමන්ගේ ජීවිතවල අත්දකින සුළු අඩු පාඩු මහ මෙරක්යයි සිතා කලකිරෙන්නේ නැතිව අනුනට දෙස් පවරන්නේ නැතිව - ඒවා මග හරවා තම දිවිය කාලකන්නි කර නොගෙන සිය දිවි හානිකර ගන්නේ නැතිව ඉදිරියට යෑමේ මෙකී ආදර්ශය ලබාගත යුතුවේ.

යහපත් සමරිතානුවරයාගේ උපමාව ඔබ කව්රුත් හොඳින් දනී. ඒ අනුව අප සමාජයේ නොයෙකුත් ආපදාවන්ට ලක්වූ දරුවන් සමාජයේ විසිරී සිටින්නේ ඔවුන් වෙත අප දක්වන ප්‍රතිචාරයත් - සත්කාරයත් කෙබඳු දැයි දැන ගැනීමටත් - ඒ වගේම ජීවිතයේ අපට උරුමවන නොයෙකුත් බාධක - පීඩා අප කෙසේ දරාග න්නේද? ඒවාට අප දක්වන අභියෝගයන් කෙලෙස දැයි කියා දෙවියන් වහන්සේ විසින් කෙරෙන විමසා බැලීමක් සඳහා දැයි යනුවෙන් අප විසින් අවධානයට ලක්කළ යුතුව තිබේ.

දුලාංජලී දිරිය දියණියගේ ජීවිතාදර්ශය සමස්ත ළමා පරපුරටම පරමාදර්ශයකි.

ඇතුගල්පුර නින්නාද සංසදයේ
**සිරිල් පෙරේරා**

## සරසවි වරම් ලබයි.....

මිනු/ සවැනි පාවුළු පාප් මහ විදුහලේ වාණිජ අංශයේ ලියනගේ අරූෂ සඳමිණ කබ්රාල් සිසුවා 2012 වසරේ පැවති අ.පො.ස.(උ.පෙළ) විභාගයෙන් ඒ සාමාර්ථ 3 ක් ලබාගෙන කතෝලික දරුවෙක් වශයෙන් විදුහලට කීර්තියක් අත්කර දෙමින් විශ්ව විද්‍යාලයට ඇතුලත්වීමේ වරම් දිනාගෙන සිටී. වාණිජ අංශයේ ඒච්.ඩී.ටී. සමරසිංහ, එච්.ඩී.එම්. සෙනවිරත්න, එච්.ඩී. තිලිනා ඩොරින් ගුරු මහත්ම මහත්මීන් සහ විදුහල්පති ගුරු බර්නාඩ් නෙවිල් පියතුමාට අරූෂ සඳමිණ දරුවා කෘතවේදිව සිහිපත් කරයි **සිසිල් ඩැනීසියස්**

# දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබාගැනීමට සූදනම් වන ඔබටයි....

**ආදරණීය දුවේ පුතේ,**

ජේසු ලබන්න සූදානම් වන ඔයාල අලුත් ඇඳුම් මහලා යාච්ඤා පාඩම් කරලා විවිධ අයුරින් ඒ සඳහා සූදානම් වනවා. ඇත්තටම කතෝලික අපිට ජේසු ලබන දවස ඉතා වැදගත් දවසක් නිසා මේ සියල්ලම ඉතා වැදගත් කටයුතු තමයි. නමුත් අපි ජේසු ලබාගන්න මොහොතකට පෙර ඒ සඳහා කිසිදු සූදානමකින් තොරව, කිසිම හැඟීමකින් තොරව ඔහේ පේලියට ගිහිල්ල නිකන් දෙන නිසා ජේසුව ලබාගෙන එන්න පුරුදු වෙලා ඉන්නවා.



මගෙ හොඳ දුවේ පුතේ, මේ ක්‍රියාව මින්පසු කිසිදාක කරන්න එපා. ජේසු අපි වෙනුවෙන් අප්‍රමාණ දුක් විඳලා මරණය පරාජය කරලා අපිට ගැලවීම අත් කරල දුන්නා. එතැනින් නැවතුනේ නැහැ. අපේ ආදරණීය ජේසු අපත් සමඟ හැමදාම මේ ලෝකෙ නවතින්න ආවා. ඒ තමයි දිව්‍ය සත්ප්‍රසාදයේ වැඩ වසන්නාවූ ජීවමාන ජේසු සමිඳුන්, උන්වහන්සේ දිව්‍ය සත්ප්‍රසාදය තුළ සිරකරුවෙක් විලසින් අප උන්වහන්සේ වෙත පැමිණෙන තුරු ඉතා නොඉවසිල්ලෙන් , ඉතා ආසාවෙන්, ප්‍රේමයෙන් හදවත පුරවාගෙන පෙරමග බලා සිටිනවා.

දුවේ පුතේ, සමහර විට ඔයාල ඉරිදා දිව්‍ය පූජාවට පමණක් විය හැකියි සහභාගි වෙන්නෙ. එවිට ජේසුට ඔයාලව හමුවන්නේ සතියකට එක් වතාවක් පමණයි. ඉතිං අපි මේ එක් වතාවවත් කිසිදු සූදානමකින් තොරව ජේසුව ලබනවා නම් අපි ජේසුට මොනතරම් වේදනාවක් අත්කර දෙනවාද?.

අපිට ජේසුස් වහන්සේ ගැන උගන්වන , අප වෙනුවෙන් මැදිහත් වන හොඳම ගුරුවරිය තමයි මරිය මාතාවන්. ඇයයි ජේසුගේ මව. ජේසු ලබන්න පෙර දණගසා දේව මාතාවන්ට සුළු යැදුමක් ඔප්පු කරන්න මින්පසු පුරුදු වෙන්න. එය ඔබට මෙසේ කළ හැකියි'' ආදර දේව අම්මේ, ඔබ පුත්‍රයාණන් මාගේ හදවතට කැඳවාගැනීමට ප්‍රථම උන්වහන්සේට වාසය කිරීමට සුදුසු ලෙස මාගේ හදවත සූදානම් කළ මැනව.

මාගේ පවු වලට සමාව ලබා දෙන ලෙස දෙවි පියාණන් ඉදිරියේ මා උදෙසා යාච්ඤා කළ මැනව''. මේ ලෙස සූදානම් වී ජේසුව ලබාගත් පසු බොහෝ වැඩිහිටියන් කරන්නාවූ වැරැද්ද පුංචි ඔයාලත් කරන්න පුරුදු වෙන්න එපා. ඒ තමයි සතියක් පුරා අප එනතුරු මගබලා සිටින ජේසුට ඔවුන් දෙන්නේ දිව්‍ය පූපය දිවේ දිය කරල ගිලින්න යන පුංචි වේලාව පමණයි.

ඉන්පසු ඒ අය කරන්නේ වටපිට බලමින් අනෙක් අයගේ ඕප දූප හොයන එකයි. දුවේ පුතේ, ඔයාලට පුළුවන් එවැනි වැඩිහිටියන්ටත් ආදර්ශයක් වෙන්න. අපිට ජේසුත් සමඟ කථා කරන්න තියන හොඳම වෙලාව තමයි මේ.

මුලින්ම ජේසුට වන්දනා කරන්න. නමස්කාර කරන්න ඒ මොකද දන්නවාද? මේ මුළු ලෝකයම මැව්ව මේ මුළු ලෝකයේම රජාණන් ඒ අවස්ථාව වන විට සුදෝ සුදු පූපයක සැඟවිලා ඔයාගෙ දිව මත වැඩ සිටින නිසා, මොනතරම් ප්‍රේමයක් අප වෙනුවෙන් ජේසුගේ හදවතේ තියෙන්න ඕනැද මේ තරම් බැහැපත් ක්‍රියාවක් කරන්න දෙවනුව ජේසුට ස්තුති කියන්න. අප වෙත මෙලෙස වැඩම කිරීම ගැන එමෙන්ම අපට මේ වෙනතුරු දී තිබෙන සියළු දේටත් , නොදුන් දේටත් ස්තුති කියන්න. මොකද ජේසු සියල්ල දෙන්නේ හෝ නොදෙන්නේ අපේ යහපත පිණිසයි. තෙවනුව පුංචි ඔයාලගෙ ඉල්ලීම් ජේසුට ඔප්පු කරන්න.

**දිනිතා ප්‍රනාන්දු**
සාන්ත මරියා දහම් පාසල - මාරවිල



සිංහල අවුරුදු උත්සවයක් පසුගියද වෙන්නප්පුව ශු. ජුසේ මුණිඳුන්ගේ දේවස්ථානයේදී පැවැත්විණි. වෙන්නප්පුව සා. ජෝශප් තරුණ සමිතිය හා දහම් පාසල් සංවිධාන කමිටුව මගින් මෙය සංවිධානය කර තිබිණි. සිංහල අවුරුදු කෙළි සෙල්ලම් සහ ජන ගායනා වැනි සංස්කෘතික අංගයන්ගෙන් සමන්විතවූ මෙය වෙන්නප්පුව මීසම් සේවක ගරු එරික් සී. ප්‍රනාන්දු පියතුමන්ගේ මග පෙන්වීම යටතේ ගරු සුජාන් නිශාන් සහ ගරු ජානක නිශාන්ත යන සහයක පියතුමන්ලාගේ අධීක්ෂණයෙන් පැවැත්විණි.

**ප්‍රියන්ත පීටර්ස්**

# ළමා ප්‍රදීපයේ කැමරා කාචයේ සටහන් වූ බක්මහ අසිරිය



නාත්තන්ඩිය නිර්මල ලූර්දු දේවමාතා සිද්ධස්ථානයේ ලූර්දු මාතා තරුණ කැල විසින් දෙවන වරටත් සංවිධානය කළ සිංහල අවුරුදු උත්සවයේ අවස්ථාවක් මෙහි දිස්වේ.

**ශ්‍රීයාංගණී පිලිෂියා**



වැලිවිට ශාන්ත මරියා පෙර පාසලේ අවුරුදු උත්සවය පසුගියද ගරු ජයලත් බලගල්ල පියතුමාගේ ප්‍රධානත්වයෙන් දේවස්ථාන භූමියේදී පැවැත්වුණි. මෙහිදී ශාන්ත මරියා පෙර පාසලේ විදුහල්පතිනි ගරු මාරි සුමුදු රත්නායක පැවිදි සොයුරිය දරු දැරියන් තරගයකට සූදානම් කළ අයුරු.

**වැලිවිට ජෝ පාරිස්**



**මාසික සිතිවිල්ල**
"මැයි මාසය"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

මාසික සිතිවිල්ල

# 2013 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## පළමු තේමාව ඇසුරෙන් පළවු ප්‍රශ්න වලට පිළිතුරු (ප්‍රශ්න අංක 72 සිට 76 දක්වා පිළිතුරු)

72. ⋆ අංශභාග රෝගියා සුවපත් කිරීම (මතෙව් 9/ 2-7)
⋆ මහලේ රෝගී ස්ත්‍රිය සුව කිරීම (මතෙව් 9/ 20 -22)

2. ⋆ ජේසුස් වහන්සේ ජෙරිකෝවේ අන්ධයා සුවපත් කොට පෙනීම ලබාදීම තුළ ''ඔබේ ශ්‍රද්ධාව ඔබ සුවපත් කළේය'' යි වදාළ සේක. ඒ තුළින් දෙවියන් වහන්සේ රෝගී සියල්ලන්ගේම ස්වාමියා බවත් ඒවායින් මනුෂ්‍යයා නිදහස් කිරීමට උන්වහන්සේට බලය ඇති බවත් පෙන්නුම් කළ සේක. උන්වහන්සේ මෙසේ මනුෂ්‍යයා රෝගී තත්ත්වයකින් සුවපත් කිරීමේ ප්‍රාතිහාර්ය දේව රාජ්‍යයේ සලකුණක් බව පෙනේ.

⋆ ගෙරසේනයේ යක්ෂාවේශවු පුද්ගලයා සුවකිරීමේ (ලූක් 8/26-39) ප්‍රතිහාර්ය තුළ අපට දැකිය හැක්කේ නපුරේ දූතයාට යටත්ව වහලුන් බවට පත්වන මිනිසාට ප්‍රාතිහාර්ය තුළින් ලැබූ නිදහස තුළ මනුෂ්‍යයාගේ බැහැර වුණු දේව රාජ්‍යය උදාවන බවය.

⋆ කුණාටුව සංසිඳුවීමේ ප්‍රතිහාර්යය (මතෙව් 8/23-27) තුළින් ස්වභාවික බලවේග කෙරෙහි උන්වහන්සේගේ ආධිපත්‍යය තහවුරු වන අතර ඒ තුළින් ප්‍රාතිහාර්ය දේව රාජ්‍යයේ සලකුණක් බව තහවුරු කළ සේක.

3. ⋆ මරණයේ වහල් කමෙන් නිදහස් කරගැනීම සඳහා කළ ප්‍රාතිහාර්යය උදා -: ජයිරස්ගේ දියණිය උත්ථාන කිරීම

⋆ විවිධ ලෙඩරෝග වල වහල්කමින් නිදහස් කර ගැනීම සඳහා කළ ප්‍රාතිහාර්යය. උදා:- අංශභාග රෝගියා සුවපත් කිරීම

⋆ ස්වාභාවික බලවේගවලට යටවීමේ වහල්කමෙන් නිදහස් කර ගැනීමට කළ ප්‍රාතිහාර්යය. උදා:- මාරුත දමනය

⋆ යක්ෂයාගේ වහල්කමෙන් නිදහස් කර ගැනීම සඳහා කළ ප්‍රාතිහාර්යය
උදා:- අශුද්ධාත්මයක් ආවේශ වූවෙකුට සුවය ලබා දීම.

73. 1. ක්‍රිස්තුස් වහන්සේගේ දුක් විඳීම, මරණය සහ උත්ථානයයි.

2. ක්‍රිස්තුන් වහන්සේගේ පාස්කු අභිරහස

3. ධර්මදානය ⟶ ''එබැවින් ඔබ ගොස් සකල ජාතීන් ශ්‍රාවකයින් කරන්න'' (මතෙව් 28/19)

⋆ ජනවන්දනාව පැවැත්වීම හා ප්‍රසාද නිධාන දානය කිරීම ⟶ ''පියාණන්ගේද , පුත්‍රයාණන්ගේද ,ශුද්ධාත්මයාණන්ගේද නාමයෙන් බව්තිස්ම ස්නාපනය කරන්න '' (මතෙව් 28/19)

⋆ ධර්මෝපදේශය ⟶ ''මා ඔබට අණකළ සියල්ල රක්ෂා කරන්න ඔවුන්ට උගන්වන්න''(මතෙව් 28/ 20)

4. ⋆ දේව රාජ්‍යය දේශනා කිරීම
⋆ යක්ෂාවේශ වූවන් සුවකිරීම
⋆ විවිධ ලෙඩ රෝග සුවකිරීම

74. ⋆ ස්වාමින් වහන්සේගේ ස්වර්ගාරෝහණයෙන් පසු අපෝස්තුළුවරු සේනාකුළුශාලාවේ දින 09 ක් යාච්ඤා කරමින් ගත කළහ. දසවෙනි දින පෙන්තකොස්ත මංගල්‍යය දිනයයි.

⋆ සැඩ සුළඟක් හමන්නාක් මෙන් හඬක් හදිසියෙන් පැමිණිනි.

⋆ අපෝස්තුළුවරු රැස්ව සිටි තැන මුළුමනින්ම එයින් පිරී ගියේය.

⋆ ගිනිදළු වැනි දිව් බෙදී ගොස් ඔවුන් එකිනෙකා මත පිහිටනු පෙනිණි.

⋆ මෙලෙස අපෝස්තුළුවරු ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ මේ දිනය නව ගිවිසුමේ පෙන්තකොස්ත මංගල්‍යයයි.

75. ⋆ සැඩ සුළඟක් ⋆ ගිනිදළු වැනි දිව්

76. ⋆ පාපය - ක්‍රිස්තුන් වහන්සේ නොඇදහීම
⋆ ධර්මිෂ්ඨකම - ක්‍රිස්තුන් වහන්සේ පියාණන් වහන්සේ වෙතට යාම
⋆ විනිශ්චය - මේ ලෝකයේ අධිපතියා විනිශ්චය කිරීම

**ගරු ඩේමියන් පෙරේරා පියතුමා**

# අවුරුදු උත්සව



''දුවන්නේ පනින්නේ සැමදේ කරන්නේ ජේසු නිසයි දම්දූතයෝ'' යන තේමාව මුල්කරගෙන හලාවත පදවි ධර්මදූත ළමා සමාජය විසින් සංවිධානය කරන ලද අලුත් අවුරුදු ක්‍රීඩා උත්සවය පදවි අනුනායක අතිගරු පීටර් චාර්ල්ස් පියතුමා, පදවි ධර්මදූත අධ්‍යක්ෂ ගරු නිශාන්ත ජානක පියතුමා, දිසා අධ්‍යක්ෂ පියතුමන්ලා ඇතුළු ගරුපියවරුන්ගේද, පැවිදි සොයුරියන්ගේද සහභාගිත්වයෙන් හලාවත සුදසුන ශාලාවේදී පැවැත්විනි.

ශූරතාවය හලාවත දිසාවටත්, අනුශූරතාව වෙන්නප්පුව දිසාවටත් හිමිවූ අතර සහභාගි වූ සියළු දරුවන්ට සහභාගිත්වය වෙනුවෙන් සහතික පත්‍රයක් පිරිනමන ලදී.

**කොකුම් වාසනා ජයරුවන්**

---

බොල්ලත සිරිහඳ දහම් පාසල බටුවත්ත, පොල්ගහවත්ත, දහම් දරුවන් සමග එකතුව සිංහල අවුරුදු උත්සවයක් පැවැත්විය.

මෙහිදි විවිධ කෙළි සෙල්ලම් , ජන කාව්‍ය ප්‍රසංග වලින් අලංකාරව, හෙළ සිරිත් විරිත්, චාරිත්‍ර ඉටු කිරීමට මුල්තැන දෙමින් පිරිහී යන සංස්කෘතික අංග වලට මුල්තැන දෙමින් සිදු කිරීම විශේෂයකි. මීසම් සේවක බර්නාඩ් රෙහාට් පියතුමාගේ මාර්ගෝපදේශකත්වයෙන් මෙය සංවිධානය කෙරිනි. **අජිත් කමල්ප්‍රිය ජයලත්**

---

රත්මලාන ශා. මරියා දෙව්මැදුර අවට වෙසෙන ''සමුදුරු'' දරුවන්ගේ බක්මහ උළෙල දේවස්ථාන භූමියේදී පැවැත්වුණි.

මෙය සංවිධානය කරන ලද්දේ බම්බලපිටිය ශු. පවුලේ කන්‍යාරාමයේ ''ෆැමිලියන් අවුට් රිච්'' සංගමයේ ශිෂ්‍යාවන් සහ ගුරුමණ්ඩලයේ සුහද දායකත්වයෙනි.

**ප්‍රේමා හීනටිගල**

# සිසු නායක පදක්කම් පැළැඳවීම

**දැලතුර කණිටු ද්වීතිය විදුහල**



මීග/ දැලතුර කණිටු ද්වීතිය විදුහලේ ශිෂ්‍ය විදුහලේ ශිෂ්‍ය නායක නායිකාවන්ට පදක්කම් පැළඳවීම එම විදුහල් ශාලාවේදී විදුහල්පති නාමල් සපරමාදු මහතාගේ සංවිධානයෙන් පැවැත්විණි. මෙදින ප්‍රධාන අමුත්තා ලෙස සහභාගිවූ තුඩැල්ල ක්‍රිස්තුරාජ විදුහලේ විදුහල්පති ගරු නිහාල් රුද්‍රිගු පියතුමා එම දරුවන් ආසිරි ගැන්වීම මෙම ඡායා රූපයෙන් දැක්වේ. **බෙන්ජමින් කිරිහෙට්ටි**

---

## ශු. ජෝන් ද බැප්ටිස්ට් මහ විදුහල – නාගොඩ

බප/මීග නාගොඩ ශු. ජෝන් ද බැප්ටිස්ට් මහ විදුහලේ 2013 පංති නායක නායිකාවන් දිව්රුම් දීම සහ නිල ලාංඡන පැළඳවීමේ උළෙල පසුගියද නාගොඩ මීසම් සේවක ගරු රන්ජන් සිල්වා පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. විදුහල්පති ඩයස් පෙරේරා මහතා සහ නියෝජ්‍ය විදුහල්පතිනි ආර්.ජ්. මේබල් මහත්මිය ප්‍රමුඛ ආචාර්ය මණ්ඩලය මෙය සංවිධානය කර තිබුණි. පංති නායක - නායිකාවන් දිව්රුම් දෙන අයුරු. **සී.ආර්. ඩික්සන් ඇන්ටනි - රාගම**



**(පසුගිය සතිය හා සබැඳේ.....)**

**19. ඉහත සඳහන් කර ඇති සියලුම කිතුනු සභාවන් සහ මූලධර්මාදී කණ්ඩායම් සමඟ සන්සන්දනය කරනවිට ශුද්ධවූ සභාවේ විශිෂ්ටත්වය පෙන්නුම් කරන අති වැදගත් මූලික කරුණ කුමක්ද?**

ශුද්ධවූ සභාව මනුෂ්‍ය පුත්‍රයාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ විසින් ස්ථාපිත කරන ලද අතර (මතෙව් 16:18 බලන්න) , අන් සියළුම කිතුනු සභාවන් සහ මූලධර්මවාදී කණ්ඩායම් ආරම්භ කර ඇත්තේ නොයෙකුත් තරාතිරමේ මනුෂ්‍යයන් විසින් ය.

**20. කතෝලික සභාවේ සාමාජිකයන් වන අප ක්‍රිස්තුන් වහන්සේ ස්ථාපිත කළ ශුද්ධවූ සභාවේ දරුවන් බව නිසැකයෙන් වටහාගන්නේ කෙසේද?**

සත්‍ය ක්‍රිස්තු සභාව විය හැක්කේ, ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපනය කරන ලද එකම සභාව හා සමඟ ඓතිහාසික වශයෙන් සම්බන්ධ වන සභාවට පමණි.

ශුද්ධවූ පේදුරු තුමාගෙන් පටන්ගෙන අඛණ්ඩව මේ දක්වා පැවත එන පාප් තනතුරද, කතෝලික සභාවේ වසර 2000ක ඉතිහාසය ද, අපෝස්තුළුවරුන්ගේ යුගයේ මුල් කිතුනු සභාව ක්‍රියාත්මකවූ ආකාරය සහ දැනට කතෝලික සභාව රදගුරු තුමන්, පූජක තුමන් සහ තේවාචාරින් තුළින් ක්‍රියාත්මක වන ආකාරය ද, කතෝලික සභාවේ සම්ප්‍රදයන් ද දෙස බලන විට මෙම සත්‍යතාවය නිසැකයෙන්ම වටහා ගත හැකිය.

ක්‍රිස්තුන් වහන්සේ එක් සභාවක් පමණක් ස්ථාපිත කළ බව ද, තම අනුගාමිකයන් අතර එක්සත්කමක් උන්වහන්සේ අපේක්ෂා කළ බව ද, ආරම්භයේදී එබඳු එක්සත්කමක් කිතුනු සභාවේ පැවති බව ද, ශුද්ධ බයිබලයෙන්ම ප්‍රකාශ වේ. ශුද්ධවූ පාවුලු තුමා මෙය මෙසේ සනාථ කරයි: ''ඔබ ප්‍රේරිතයන්ගේ ද, දිවැසිවරයන්ගේද අත්තිවාරම පිට ඉදි කරනු ලැබ සිටින්නහු ය. එහි කොණේ ප්‍රධාන ගල නම් ක්‍රිස්තුන් වහන්සේ ම ය..... උන්වහන්සේ තුළ ඔබත්, ආත්මයාණන් වහන්සේ කරණකොටගෙන දෙවියන් වහන්සේගේ වාසස්ථානය සඳහා එක් කොට ගොඩනගනු ලැබේ'' (එපීස 2:20-22)

ක්‍රිස්තුන් වහන්සේ විසින් තම සභාවේ නායකධුරයට පේදුරු තුමා පත් කරන ලද බව ශුද්ධ බයිබලයෙන් හෙළි වේ. - (මතෙව් 16:18-19 සහ ජොහන් 21:15-17 බලන්න.) එසේනම් , සත්‍ය ක්‍රිස්තු සභාව වන්නේ, පේදුරු තුමා හා සම්බන්ධ සභාව යි: එතුමාගේ මූලිකත්වය පිළිගන්නා සභාවයි. පේදුරුතුමා කොතැන ද සත්‍ය සභාව එතැන ය.

**21. ශුද්ධවූ සභාව ''රෝමානු කතෝලික සභාව '' නමින් හැඳින්වන්නේ ඇයි?**

''රෝමානු'' යන්නෙන් අදහස් කරන්නේ, අපෝස්තුළු යුගයේ පටන් සභාවේ නායකයාණන්ගේ වාසස්ථානයත්, පාලනයේ කේන්ද්‍රස්ථානයත් රෝම නගරය වීම ය. ''කතෝලික ''යන ග්‍රීක වචනයෙන් හඟවනු ලබන්නේ, එම සභාව, කිසිම රටක ට, ජාතියකට, කුලයක ට හෝ ජන කොටසක ට සීමා නොවී, සකල මනුෂ්‍යයන්ගේ ලෝකෝත්තර ශුභසිද්ධිය පරමාර්ථ කොට ගෙන ක්‍රියාවේ යෙදෙන බවය.

**22. 16 වෙනි සියවසේ සිට අද දක්වා ඇතිවූ සභා භේද සහ බෙදීම් සියල්ලටම හේතුවූ ප්‍රධාන කරුණු මොනවාද?**

1. වර්ෂ 1517 දී පමණ මාර්ටින් ලූතර් ඇරඹූ සංශෝධන හේතුවෙන් ඔහු විසින් පුරාණ ගිවිසුමෙහි අඩංගු ග්‍රන්ථ 46න් ග්‍රන්ථ 7 ක් සහ තවත් ග්‍රන්ථ දෙකකින් පාඨයන් කීපයක් ශුද්ධ ලියවිලි වලට ඇතුළත් කිරීමට සුදුසු නැති බව පවසමින් තමන්ගේ හිතුමතේට සංශෝධනය කරන ලද බයිබලයක් සකස් කිරීම

2. ශුද්ධ ලියවිල්ල තේරුම් ගැනීමට සභානායකයන්ගේ උපදෙස් අවශ්‍ය නැති බවත්, තම තමන්ට පුද්ගලිකව වැටහෙන දෙයින් දේව වචනය තේරුම් ගත හැකි බවත් මාර්ටින් ලූතර් පැවසීම.

**23. මාර්ටින් ලූතර් විසින් ප්‍රතික්ෂේප කරන ලද ග්‍රන්ථ සහ පාඨයන් කවරේද? මෙම ග්‍රන්ථ සහ පාඨයන් ඔහු ප්‍රතික්ෂේප කළේ ඇයි?.**

පුරාණ ගිවිසුමට අයිති වන, තෝබිත්, ජුඩිත්, සලමොන්ගේ ප්‍රඥාව, උපදේශකයා හෙවත් සිරාක්, මකබිවරුන්ගේ පළමු වන පොත , මකබිවරුන්ගේ දෙවන පොත, සහ බාරුක් යන ග්‍රන්ථ මෙන්ම, දනියල් සහ එස්තර් යන ග්‍රන්ථවලින් පාඨයන් කීපයක් ලූතර් විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

හෙබ්‍රෙව් බසින් ලියැවුණු පුරාණ ගිවිසුමෙහි ඇත්තේ ග්‍රන්ථ 39 ක් පමණි. ඉහත සඳහන් ග්‍රන්ථ සහ පාඨයන් එහි අඩංගු වී නැති හෙයින් ඒවා මාර්ටින් ලූතර් විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

# කතෝලික සභාවේ විශිෂ්ටත්වය

**24. ඉහත සඳහන් ග්‍රන්ථයන් ශුද්ධ ලියවිල්ලෙහි අඩංගු වී ඇති බව අප දන්නේ කෙසේද?**

මෙම ග්‍රන්ථ 7 සහ පාඨයන්, ක්‍රිස්තු පූර්ව 3 වන සහ 2 වන ශතවසර වලදී ග්‍රීක් භාෂාවෙන් ලියැවුණු පැරණි ගිවිසුමෙහි අඩංගු වී ඇත. ''සෙප්ටුආජින්ට්'' නමින් හැඳින්වෙන මෙම පැරණි ගිවිසුමෙහි ග්‍රන්ථ 46 ක් ඇත. නව ගිවිසුම් කතෘවරුන් තම ග්‍රන්ථයන් ලිවීමේදී බොහෝ අවස්ථාවන්හි භාවිත කර ඇත්තේ ''සෙස්ටුආජින්ට්'' ග්‍රීක පිටපතය. (වැදගත් උදහරණයක් වන්නේ මතෙව් 1:23 හි සඳහන්වන ''මෙන්න, කන්‍යාවක් ගැබ්ගෙන පුතෙකු බිහි කරන්නීය....'' යන වදන් උපුටාගෙන ඇත්තේ ''සෙප්ටුආජින්ට්'' පැරණි ගිවිසුමේ යෙසායා 7:14 දිවැසිවැකියෙන් ය. හෙබ්‍රෙව් බසින් ලියැවුණු පැරණි ගිවිසුමෙහි මෙම දිවැසිවැකිය ලියා තිබෙන්නේ ''මෙන්න, තරුණ ස්ත්‍රියක් ගැබ්ගෙන '' යනුවෙන් ය.)

තවද හෙබ්‍රෙව් සහ ග්‍රීක භාෂාවෙන් ලියැවී තිබුණු පුරාණ සහ නව ගිවිසුම් ග්‍රන්ථ සියල්ලම ලතින් භාෂාවට පරිවර්තනය කිරීම සඳහා පළමුවන ඩැමසස් පාප්තුමන් විසින් වර්ෂ 382 දී සාන්ත ජෙරෝම් තාපස තුමන් පත්කරන ලදී. වර්ෂ 386 දී බෙත්ලෙහෙම් නගරයට ගිය එතුමා, අවුරුදු 20 ක් වැනි දිගුකාලයක් මුලුල්ලේ එහි නැවතී සිට පරිවර්තනය කළ පුරාණ සහ නව ගිවිසුම් දෙක ''වෙල්ගේට්'' පරිවර්තනය ලෙස හැඳින්වේ ඉහත සඳහන් මාර්ටින් ලූතර් විසින් ප්‍රතික්ෂේප කරන ලද ග්‍රන්ථ හත සහ පාඨයන් සියල්ල ම මෙම ''වල්ගේට් '' පරිවර්තනයෙහි අඩංගු වී ඇත.

එබැවින් මාර්ටින් ලූතර් විසින් මෙම ග්‍රන්ථ 7 සහ පාඨයන් ප්‍රතික්ෂේප කිරීම කිසිසේත් පිළිගත නොහැක.

**25. දේව වචනය තේරුම් කරදීම ශුද්ධවූ සභාවේ නායකයන්ගේ වගකීම බව අප දන්නේ කෙසේද? දේව වචනය පුද්ගලික අර්ථකථනයට ලක් කිරීමට එරෙහිව අපට අවවාද කර ඇත්ද?**

1. නව ගිවිසුමේ ග්‍රන්ථ ලියවෙන්නට පෙර කිතු දහම ජනතාවට ප්‍රකාශ කර තේරුම් කර දුන්නේ අපෝස්තුළුවරුන් සහ ඔවුන් විසින් පත්කරන ලද සභා මූලිකයන් ය. (උදා:- ක්‍රියා 2:14-36 / 2:42 / 4:1-4 / 4:8-12 / 13:1-4 / 14:1-28 / 15:22-35). තවද, මෙය සනාථ කරන විශේෂ සිදුවීමක් වන්නේ, දිවැසිවර යෙසායාගේ පොත කියවමින් ගමන් කරමින් සිටි ඉතියෝපියානු ජාතිකයාට දේව වචනය තේරුම් කර දීම පිණිස ස්වමින් වහන්සේගේ දූතයෙක් පිලිප් ව ඔහු වෙත යැවීමයි. (ක්‍රියා 8:26-40)

2. දේව වචනයට පුද්ගලික අර්ථකථනයක් දීමට එරෙහි ව ශුද්ධවූ පේදුරු තුමන් සෘජුවම මෙසේ අවවාද කර ඇත. ''එහෙත් ශුද්ධ ලියවිල්ලෙහි එන දිවැස් වැකියන් කිසිවෙකුට තමා විසින් ම විසඳ ගැනීම නොහැකි බව පළමුකොට ඔබ දැනගත යුතු ය'' (2 පේදුරු 1:20). තවද 2 පේදුරු 3:16 බලන්න.

**26. ශුද්ධ බයිබලය නොවරදින සුළු හෙයින් එක් එක් තැනැත්තාට එය කියවා පෞද්ගලික වශයෙන් තේරුම් ගත හැකිද?**

මෙය මූලධර්මවාදීන් විසින් පතුරුවන තවත් මතයකි. ඇත්ත වශයෙන් දේව වචනය නොවරදින සුළුය. එහෙත් ශුද්ධ බයිබලයේ ඇති නොයෙකුත් ප්‍රකාශණවලින් දෙවියන් වහන්සේ විසින් අදහස් කරන ලද්දේ කුමක් දැයි ස්ථිර වශයෙන් අප දැනගන්නේ කෙසේද ? ක්‍රිස්තුන් වහන්සේ දෙසූ වචනවල නියම අර්ථය කුමක් දැයි අප දැනගන්නේ කෙසේද?

කිතු තුමන් දෙසූ දහම බෙදීගිය කිතුනු සභාවන් සහ මූලධර්මවාදී කණ්ඩායම් විසින් වෙනස්ව තේරුම් ගෙන තිබීමෙන්ම පෙනී යන්නේ ශුද්ධ බයිබලයේ ප්‍රකාශයන්ගෙ නියම අර්ථය දැනගැනීමට නියම මගක් තිබිය යුතු බවය. එවැනි මගක් ක්‍රිස්තුන් වහන්සේ විසින්ම සපයා දී ඇත. එනම් ක්‍රිස්තුන් වහන්සේ තම බැටළුවන් පෝෂණය කිරීම පේදුරු තුමාට භාර කළා (ජොහන් 21:15-17) පමණක් නොව එම භාරය ඉටු කිරීමේදී නොවැරදීමේ වරයක්ද පේදුරු තුමාට දනය කළ සේක, (මතෙව් 16:19) මින් ඉහත (8හි) සඳහන් කර ඇති පරිදි, මෙම වගකීම අද පැවරී තිබෙන්නේ සෑම පදවියක්ම භාරව සිටින රදගුරු තුමන්ලා සහ රදගුරු තුමන් අතරින් ප්‍රමුඛයා වන පාප් තුමන් වෙතය.

ශුද්ධ බයිබලයේ සඳහන් දේ පෞද්ගලික අර්ථකථනයට භාජනය නොකළ යුතු බව පේදුරු තුමන් (2පේදුරු 1:20 හි) අපට අවවාද කර ඇති බව මින් ඉහත (25හි) සඳහන් කර ඇත.

**ලබන සතියට...**

✍ **වික්ටර් සිල්වා**



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම
මයිකල් ඇන්ජලෝ
ප්‍රනාන්දු විසිනි.

පාඩම් අංක : 94

## Will

"Will" කියන වචනය 1 st , 2 nd, සහ 3 rd යන පුරුෂ තුනේදීම අපි භාවිත කරන්නේ **පැහැදිලිවම අනාගතය ගැන කීමට.** උත්තම පුරුෂ වලදී පමණක් Shall යෙදීමෙන් මේ අදහස ලැබෙන බව අපි ඉගෙන ගත්තා.

"විල්" සාමාන්‍යයෙන් යොදන්නේ ලිහිල්ව අනාගතයේදී යමක් කරන්නම් කියන අදහස කීමට. යමක් අනාගතයේදී සිදුවේවි හෝ සිදුවනවා යන අදහස කීමට will යොදනවා.

⋆ It ***will*** rain tomorrow. (ඉට් විල් රේන් ටුමාරෝ) හෙට වහිවී

⋆ He ***will*** come to the party. (හී විල් කම් ටු ද පාර්ටි)
ඔහු පාටියට එනවා. (හෝ ඒවි)

⋆ ***Will*** you be at home this evening?
(විල් යූ බී ඇට් හෝම් දිස් ඊව්නින්?) ඔබ අද හවස ගෙදර ඉන්නවද? (ඉදීවිද?)

⋆Yes, I ***will*** be at home. ඔව් මම ගෙදර ඉන්නවා. (ලිහිල්ව, ස්ථිරත්වයකින් නෙමේ)

⋆ They are going to Matara. But they ***will*** not go to Kataragama.(දේ ආ(ර්) ගොයිංටු මාතර. බට් දේ විල් නොට් ගෝටු කතරගම.) ඒ ගොල්ලො මාතර යනවා. ඒත් ඒ ගොල්ලො කතරගම යන එකක් නෑ. (යන්නෙ නෑ)

⋆ I ***will*** carry your bag. (අයි විල් කැරී යුවර් බෑග්) මම ඔබේ බෑග් එක උස්සන් යන්නම්. (මම කැමත්තක් කරන්නම් කියන අදහස)

⋆ I ***will*** surely help you. (අයි විල් ෂුවර්ලි හෙල්ප් යූ) මම ඔබට ඇත්තෙන්ම උදව් කරනවා. (මෙහිදී උදව් කිරීමට පොරොන්දු වන තරමේ අදහසක් පිළිබිඹු වෙනවා.)

⋆ I am sorry. I ***will*** not do it again. (අයි ඇම් සොරි. අයි විල් නොට් ඩූ ඉට් අගේන්) මට සමාවෙන්න. මං ආයෙ එහෙම කරන්නෙ නෑ මෙතනදිත් පොරොන්දුවන බවක් කියවෙනවා.

⋆ I ***will*** pay you next week. (අයි විල් පේ යූ නෙක්ස්ට් වීක්)
මම ලබන සතියේ ගෙවන්නම්. (මෙතනදීත් පොරොන්දුවක් කියැවෙනවා)

⋆ I ***will*** pass the exam. (අයි විල් පාස් දි එක්සෑම්)
මම විභාගෙ පාස්වෙනවා.

මෙහිදී will කියන වචනය තදින් ස්ථිර බව ප්‍රකාශ කරන ස්වරයකින් කිව්වොත් අධිෂ්ඨානාත්මක බවක් එයින් පිළිබිඹු කළ හැකියි.

⋆ When you pass the bridge you ***will*** see a church.
(වෙන් යූ පාස් ද බ්‍රිජ් යූ විල් සී අ චර්ච්)
ඔබ පාලම පහුකරද්දී පල්ලියක් හමුවේවි...

ප්‍රශ්නයක විලාසයෙන් **Will** මුලට යොදූ වැකියක් හැදුවොත් ඒකෙන් ආරාධනා කිරීමක් හෝ ඉල්ලීමක් වැනි අදහසක් කියැවෙනවා.

⋆ ***Will*** you have some lunch? (විල් යූ හැව් සම් ලන්ච්)
කෑම ටිකක් කනවද? (ආරාධනාවක් වගේ) කෑම කකා ඉන්දැද්දි යාළුවෙක් ආවොත් ඔහුටත් ආරාධනා කිරීමක් ලෙස will යෙද ප්‍රශ්නයක් අසන්න පුළුවන්.

⋆ ***Will*** you join me for lunch? (විල් යූ ජොයින් මී ෆො(ර්) ලන්ච්?) මාත් එක්කම කෑම ටිකක් කනවද?

ඒ වගේම ඉල්ලීමක් කරද්දිත් will යොදන්න පුළුවන්.

⋆ ***Will*** you please give me your motorcycle? (විල් යූ ප්ලීස් ගිව් මී යුවර් මෝටර් සයිකල්) මට ඔබේ මෝටර් සයිකලය ටිකක් දෙනවද?

නමුත් මෙහිදී ඉතා කරුණිකව ඉල්ලීමක් කරනව වගේ අදහසක් මතුවෙන්නෙ නෑ. සමීප කෙනකුගෙන් බයිසිකලය ඉල්ලීමක් කරන අදහස පමණයි. ගරුසරු ඇතිව යමක් ඉල්ලීමට මෙහෙම Will you give me... කියන්නෙ නෑ.
Could you please give me.... වගේ යෙදුමක් වඩාත් උචිතයි.

ඒ වගේම ක්ෂණිකව ඒ මොහොතේ ගන්නා තීරණ සඳහාත් යොදන්නේ **Will.**

**නිදසුන් :-**

I have left my computer on. I ***will*** go and switch it off.
(අයි හැව් ලෙෆ්ට් මයි කම්පියුටර් ඔන්. අයි විල් ගෝ ඇන් ස්විච් ඉට් ඕෆ්.)
මගේ කම්පියුටරය ඇල ආවේ (වැහුවේ නැහැ) මම ගිහින් ඒක වහල එන්නම්. මෙතැනදී ඒ තීරණය ගන්නෙ ක්ෂණිකව. කතා කරන වෙලාවෙදි.

මේ දෙබස බලන්න.
Nimal : Oh! You have passed the exam. Haven't you!
ඔබ විභාගෙ පස්වෙලා නේද?
You must give us a party. අපිට පාටියක් දෙන්න ඕනා.

Kamal : Ok. I ***will*** give you a party. හරි මං පාටියක් දෙන්නම්. මෙතැනදීත් පාටියක් දෙන්න තීරණය කරන්නෙ මේ කතා කරන මොහොතේදී. කලින් තීරණයක් අරගෙන තිබුණු දෙයක් නොවේ.

# ක්‍රිස්තියානි කලාවේ අගතැන්පත් කලාකරුවෝ

## කතෝලික සංගීතයේ වර්ධනය 15

මෙම ගොඩනැගිල්ලේ ප්‍රධානතම ලක්ෂණය වනුයේ එහි මැද කොටස තනි ශාලාවක් වීමය. ශාලාව තුළ එක කණුවක්වත් නොවීය. එම නිසා මෙතෙක් වූ හැම දේවස්ථානයක්ම දක්නට ලැබුණ පරිදි ප්‍රධාන ශාලාව මැදි පුළුල් කොටසකට හා පටු කොටස් දෙකකට බෙදුනේ නැත.

එම හේතුවෙන් කොතනක සිට හෝ වුවද බාධකයක් නොමැතිව පූජාසනය නැරඹිය හැකිවිය. දේවස්ථානයේ ඉදිරිපස හෙවත් මුහුණතද තරමක් අමුතු විය. එය දොර ජනෙල් වලින් යුතු වූ එසේම තරමක් පළල්වූ පහත තට්ටුවකින් ජනෙල්වලින් පමණක් යුක්ත වූ එසේම පහත එකට වඩා පටුවූ දෙවැනි තට්ටුවකින්ද යුක්ත වීය. ඒ තට්ටුව ත්‍රිකෝණාකාර මුදුන් තට්ටුවකින් අවසන් විය.

මෙම ''ගේසු'' දේවස්ථානය ''බරෝක'' නමින් හැඳින් වෙන්නට වූ ගොඩනැගිලි කලා ක්‍රමයේ පුරෝ ගාමිකයා සේ සැලකෙන්නට විය. ''බරෝක'' වචනයේ සාමාන්‍ය අර්ථය ''සැරසිලි සහිත'' 'ආයිත්තම් ආකාර' හෝ ''විසිතුරු'' වැන්නකි. එක්තරා ගාම්භීරත්වයක් දැක්වීම එම කලා ශෛලියේ ප්‍රධාන අරමුණ විය.

එම නම මූලික වශයෙන් භාවිත වුයේ එක්තරා ගොඩනැගිලි ශෛලියක් දැක්වීමටය. එහෙත් ගොඩනැගිලි ශෛලියක් සේම ගොඩනැගිලි සැරසීමට භාවිත වූ චිත්‍ර හා කැටයම් වල ශෛල ලක්ෂණ දැක්වීමටද එය භාවිත විය.



බරෝක දේවස්ථාන අතිශයින් ගාම්භීර වූ විලාශයකට පිළිමවලින් ද චිත්‍ර වලින්ද සරසනු ලැබුණේය. දේවස්ථානයේ ප්‍රධානතම චිත්‍රය සම්පූර්ණ සිවිලිමම වැසෙනසේ සකස්කර තිබුනේය. උඩ බැලූ විට මුළු දේවස්ථානයම සාන්තුවරයන් ගෙන් හා දේව දූතයන්ගෙන් පිරී ඇති එකක් සේ පෙනෙන විලාශයකට එම චිත්‍රය නිර්මාණය කර තිබුණේය.

එහෙත් පුද්ගලයින් සංඛ්‍යාවකගෙන් යුත් එවැනි චිත්‍ර ඇඳීම එතරම් පහසු නොවීය. නියම වශයෙන් සකස් නූනානම් එය මහත් පාද ගොඩක් සේ පෙනෙන්නට පුළුවන. එම නිසා ඇතැම් දේවස්ථානවල චිත්‍රය දෙස බැලිය යුත්තේ කොතන සිටද කියා දැක්වීමට පොලවේ එක තැනක් සළකුණු කර තිබුණේය.

එතැන සිට බැලුවිට එම චිත්‍රයේ එක්සත් භාවය තරමක් ආශ්චර්යමත් වූ විලාශයකට දිස් වෙන්නට විය. ''බරෝක'' නමින් හැඳින්වෙන කලා ශෛලියේ මධ්‍යස්ථානය රෝමයම විය. එම ශෛලියේ විශිෂ්ටතම ශිල්පියා වූයේ ගියන් ලොරෙන්සෝ බර්නිනි 1598 - 1680 ය. ඔහු චිත්‍රකරුවෙක් නොවීය. එහෙත් දීප්තිමත් ගොඩනැගිලි කරුවෙක්ද අද්වීතීය. ගණයේ කැටයම් කරුවෙක්ද විය.

සාන්ත පීතර දෙව්මැදුරේ පූජාසනය ඉහලින් ඇති ලෝකඩ උඩුවියන සකස් කළේ ඔහුය. එම දෙව්මැදුර ඉදිරිපස ලක්ෂ සංඛ්‍යාත ජනකායකට ඉඩකඩ ඇති මහා චතුරශ්‍රයද එම චතුරශ්‍රය වටා තනා ඇති මහා කුළුණු පේළි දෙකද සකස් කළේ ඔහුය.

දෙව්මැදුරේ ඉදිරිපස බිත්තියේ දෙකෙළවරට සම්බන්ධවී තිබෙන එම කුළුණු පේළි දෙක කාටවුවද දිස්වෙන්නේ ජනයා පිළිගෙන වැළඳ ගැනීමට දෙව්මැදුරෙන් දිගු කෙරුන මහා අත් දෙකක් සේය. ඔහුගේ කැටයම් අතරින් ''භාවනාවේ සාන්ත තෙරේසා'' යනුවෙන් හැඳින්වෙන පිළිමය අග්‍ර කලා අගයකින් සේම විශාල ආධ්‍යාත්මික අගයකින්ද යුක්ත වූවකි.

ඉහත දැක්වුන ගොඩනැගිලි හා කැටයම්වල විශේෂ ශෛලිය දැක්වීමට සම්ප්‍රදායනුකූලව භාවිත වෙන ''බරෝක'' යන නම නූතනයෙකුට එතරම් අර්ථවත් නොවන්නට පුළුවන. එහෙත් එම නම නොවේනම් වෙනත් නමකින් හෝ හැඳින්වීමට අවශ්‍ය වන තරමට මෙම යුගයේ කලා කෘති වල විශේෂත්වයක් තිබුණේය. ඊට හේතුව එක විශේෂ ඓතිහාසික අවශ්‍යතාවයක් මත ඒවා බිහි වන්නට වීමය.

**සංස්කාරක පියතුමන් විසිනි**

ඉදිරියට .......



## පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර
පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර,
A4 ( හාෆ්ෂීට් කොලවල ඇඳ )
පාසලේ හෝ දහම් පාසලේ පංති භාර
ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ
නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ
පෞද්ගලික
ලිපිනය හා දුරකතන අංකය ද සහිතව
යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



### ලස්සන පරිසරය
රූත් චානුක්‍යා ජයවර්ධන
01 ශ්‍රේණිය
ශු. ජපමාල දේව මාතා දහම් පාසල
මිරිගම

### මෝස්තරයක්
සිත්මල් උදන සිල්වා
03 ශ්‍රේණිය
ලොයොලා විද්‍යාලය - බෝපිටිය



### සදා සරණ දේව අම්මා
නිමාෂා රුවිශානි රෙපිනෝල්ඩ්
06 ශ්‍රේණිය
නාරද මධ්‍ය මහා විද්‍යාලය - පත්බේරිය



### ශුද්ධාත්මයාණන් වැඩම කිරීම
දිනිත් දෙව්ශාන් ප්‍රනාන්දු
06 ශ්‍රේණිය
සාන්ත අන්තෝනි දහම් පාසල
කීරපත්දෙනිය



### ජේසු සමිඳුන්
සෙතුමි දිනායා
02 ශ්‍රේණිය
සාන්ත අන්තෝනි දහම් පාසල
කිරිමැටියාගාර



### මුහුදු වෙරළ
ඇන්ඩෘා බෝගහලන්ද
02 ශ්‍රේණිය
සාන්ත ජෝශප් විදුහල -
කොළඹ 10

# කොළඹ සාන්ත ජෝශප් විදුහලේ ආදර්ශයක්


වාර්ෂික මංගල්‍ය සඳහා කොඩිගස එසැවූ අවස්ථාව

ගමක , මීසමක වාර්ෂික මංගල්‍යය වෙනුවෙන් කොඩි ගස එසවීම සාමාන්‍ය කතෝලික සිරිතක් වුවත්, පාසලක නාම සාන්තුවර දින එවැනි කොඩි ගසක් ඔසවනු ලැබීම දුර්ලභ සිද්ධියකි. කොළඹ , සාන්ත ජෝශප් විදුහල් දිනය නිමිත්තෙන් සිසු , ගුරු හා සියළු සේවක පිරිස් එකාවන්ව වාර්ෂික මංගල්‍යයට සූදානම් වී සඳහා දින අටකට පෙර කොඩිගස ඔසවනු ලැබූ අතර කිරිබත් සංග්‍රහයක්ද භුක්ති විඳීමේ අවස්ථාවක් සළසා තිබිණි.

එදින සිට සතිය පුරාම එක් එක් අංශවල සිසු දරුවන් සඳහා දේශක ජීවන්ත පීරිස් ගරු පියතුමාගේ මෙහෙයවීමෙන් නුවාන සිදු කෙරුණි.

වාර්ෂික මංගල්‍යය නායකකන්ද මීසම් සේවක ආදි සිසු මහේන්ද්‍ර ගුණතිලක ගරු පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි.

විදුහල් අදියුරු ගරු සිල්වෙස්ටර් රණසිංහ පියතුමාගේ උපදේශකත්වයෙන් මංගල්‍ය කටයුතු ඉතා චාම් හා අර්ථාන්විතව සිදුවීම මෙහි විශේෂත්වයකි.

**සටහන :- ස්ටැනිස්ලස් පයස්**
**සේයා :- නවීන්ද්‍ර අබේසුන්දර - තිලාන් පෙරේරා**
**ජොසපියානු මාධ්‍ය කවය**


කොඩිගස එසැවීමෙන් පසු කිරිබත් සංග්‍රහය භුක්ති විඳි ආකාරය

# ජපමාලය යදිමින් මල් මාසය අර්ථවත් කර ගනිමු

මැයි මාසය දෙව්මව සමරන මාසයයි. මරි මව යදින්නට සුදුසුම ආකාරය ජපමාලයයි. මරිමවට කැප කළ මාසයේදී පමණක් නොව මෙලොව ජීවතුන් අතර සිටින තුරුම ජපමාලය ළඟ තබා ගැනීමට සහ උච්චාරණය කිරීමට, කිතුනු දරුවන් ලෙස අප උත්සුක විය යුතුය.

මරියතුමියගේ මැදහත්කම තුළ දේව ආදරය පතන පුංචි අපට දෙව් සමිඳාණෝ පිහිට වනු ඇත. ශුද්ධවර මතෙව් තුමාගේ සුභ අස්නේ මෙසේ සඳහන්ව ඇත. ''යම් තැනක දෙදෙනෙක් හෝ තුන්දෙනෙක් හෝ මාගේ නාමයෙන් රැස්ව සිටිත් ද එතැන ඔවුන් මැද මමත් වැඩ සිටිමි''. ජීවිත වලට සහනය අවශ්‍ය වූ විට පමණක් අප ජපමාලය යැදීමට පුරුදු වී සිටින්නෙමු.

මරිමවට කැපකළ මේ මැයි මාසය අපගේ ජීවිතවලට නව ආරම්භයක් ලබා ගනිමු. ජීවිත ගමනේදී මුහුණ දීමට සිදුවන සැප දුක් සිනහ කඳුළු සෑම අවස්ථාවකදීම මරිමවත් සමඟින් සිටීමට සිතාගනිමු.

**අශේන් සාවින්ද සේනාරත්න**
**ශාන්ත බෙනඩික් විදුහල - කොළඹ 13**






# ප්‍රහේලිකා අංක 37

හරහට

1. යහපත් සමරිතානු වරයාගේ උපමාවේ සොරුනට අසුවූ මිනිසා ගමන් කරමින් සිටියේ මෙම නගරයටය.

4. යහපත් සමරිතානු වරයා සොරුනට අසුවූ මිනිසා ලඟට ගොස් තෙල් සහ මිදියුෂ ගල්වා ........බැඳ තමාගේ මෘගයා පිට හිඳුවා තානායමට ගෙන ගොස් ඔහු බලා ගත්තේය. මෙහි හිස්තැනට සුදුසු වචනය .

5. තමාට විරුද්ධව පව් කරන සහෝදරයාට කමා විය යුත්තේ මෙපමණක් දක්වා පමණදැයි පේදුරුතුමා ක්‍රිස්තුන් වහන්සේගෙන් ඇසුවේය.

7. ක්‍රිස්තුන් වහන්සේගේ ගෝලයෝ උපවාස නොකරන්නේ මන්දැයි ක්‍රිස්තුන් වහන්සේගෙන් ඇසූ අවස්ථාවේදී ''.......... තමන් සමග සිටියදී ඔහුගේ ඥාති මිත්‍රාදින්ට ශෝක විය හැකිදැයි'' උන්වහන්සේ වදාළ සේක. හිස්තැනට සුදුසු වචනය

10. ලාසරස්තුමාගේ එක් සහෝදරියකගේ නම

පහළට

1. ක්‍රිස්තුන් වහන්සේ රාජ තේජසින් මෙම නගරයට වඩිනා විට ''සමිඳුන් නමින් වඩිනා රජුට ආසිරි වේවා'' යි කියමින් මිනිසුන් දෙවියන් වහන්සේට ප්‍රශංසා කළෝය

2. ස්නාවක ජුවාම් තුමා මිනිසුන්ව බව්තීස්ම ස්නාපනය කළේ මේවායින් බවත්, ක්‍රිස්තුන් වහන්සේ පැමිණි පසු ශුද්ධාත්මයාණන්ගෙන්ද, ගින්නෙන්ද මිනිසුන්ව බෞතීස්ම ස්නාපනය කරන බවත් ජුවාම් තුමා ප්‍රකාශ කළේය.

3. කුරුසිය දරාගෙන මා අනුව නොඑන තැනැත්තාට මාගේ ......... විය නොහැකිය'' යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. හිස්තැනට සුදුසු වචනය

6. අංශබාග රෝගියාව සුවකර ගැනීම සඳහා ක්‍රිස්තුන් වහන්සේ ඉදිරියට පැමිණෙව්වේ මෙට්ටයක තබා නිවසේ මෙය තුළින් පහලට බැස්ස වීමෙනි.

8. ගෝලයන් සැත්තෑ දෙනාගේ ධර්මදූත මෙහෙය අවසානයේදී ක්‍රිස්තුන් වහන්සේ වෙතට හැරී ආ විට ඔබගේ ......... ස්වර්ගයෙහි ලියා ඇති නිසා සංතෝෂ වන්නැයි ක්‍රිස්තුන් වහන්සේ වදළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

9. ක්‍රිස්තුන් වහන්සේ තම දුක් ප්‍රාප්තියට පෙර ගෝලයන්ට කථා කරමින් ''මම ඔබහට සැබෑව පවසමි. මාගේ නික්ම ...... ඔබගේ ශුභ සිද්ධිය පිණිසය'' යි කී සේක. හිස්තැනට සුදුසු වචනය.

(මෙම ප්‍රහේලිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපයෝගී කර ගත හැකිය. ශු. ලූක් 3,5,10,11,14,19 පරිච්ඡේද , ශු. මතෙව් 9, 18 පරිච්ඡේද ශු. ජුවාම් 16)

සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා - කිරිමැටියාගාර

**ප්‍රහේලිකා අංක 37 සඳහා පිළිතුරු ලබන සතියේ**




## කොටහේන යහපත් එඬේරා කන්‍යාරාමය , ප්‍රාථමික අංශය

කොටහේන යහපත් එඬේරා කන්‍යාරාමයේ , ප්‍රාථමික අංශයේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවය පසු ගියදා ශා. බෙනඩික් විදුහල් ක්‍රීඩාංගනයේ පැවැත්විනි.

එහිදී ප්‍රථම ස්ථානය ලබා ගත් වයලට් නිවාසයේ දැරියන් හා ගුරුභවතුන් මෙදින ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස පැමිණි විදුහලේ ආදි සිසුවියක වන ඩැල්රින් සෙනවිරත්න මහත්මිය ද, විදුහල් පති. ගරු රේණුකා සිල්වා ප්‍රාථමික අංශ බාර ගරු නිලානි සිල්වා සොහොයුරියත් සමඟ සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු. **ශිවන්ති වර්ජනී**




තම ජාතිය වහල් භාවයෙන් මුදාගත්.....
මෝසෙස්
ශුද්ධවූ බයිබලය ඇසුරෙන් චිත්‍ර කථා රචනය ... ආනන්ද කාලිදේරා..
1
චිත්‍ර: ඇස්. ඒ. පී. සපුආරච්චි
මෝසෙස් තුමා ජීවත් වූයේ.. ක්‍රිස්තුස් වහන්සේ උපදින්නටත් අවුරුදු දහසකටත් වඩා ඉහත කාලයකදීය.... ඊශ්‍රායෙල් නමින් හැඳින්වූ යාකොබ්ගේ පරපුරෙන් පැවත ආ නිසා මෝසෙස්ගේ ජාතියද ඊශ්‍රායෙල් නමින් හැඳින්වන ලදී
මෝසෙස් තුමා ඉපදීමටත් අවුරුදු සිය ගණනකට පෙර යාකොබ් නම් තැනැත්තෙක් කානාන් දේශයෙහි ජීවත් විය.. ඊශ්‍රායෙල් ජාතිකයන් වූ ඔවුනට මහා දරුණු සාගතයකට මුහුණ පාන්නට සිදුවිය...
ආහ්.. අපේ ගොවිබිම් ඔක්කොම විනාසයි
පුදුම සාගතයක් මේක.. අපේ බැටළුවො ඔක්කොම විනාසයි..
ආහ්.. වතුර.. ..වතුර..
දැන් කීදෙනෙක් මේ.. සාගතයෙන් මිය ගියාද.. ආහ්..
එම සාගතය නිසා යාකොබ් තම පුත්‍රයන් දොළොස් දෙනා අමතා..
අපට මේ.. සාගතයත් එක්ක මේ රටේ ජීවත් වෙන්න අමාරුයි.. ඒ නිසා අපි වෙනත් දේශයකට යමු....
යාකොබ් සිය පුතුන් දොළොස් දෙනා සමග ඊජිප්තුවට පැමිණියේය...


ශු. ප්‍රැන්සිස් මුණිඳුන්ගේ
කතාව
අසීසි නගරයේ දිළින්දා
ඉදිරිපත් කිරීම -
ආමල් ද සිල්වා
24
ප්‍රැන්සිස් ජනයාට දෙවියන් වහන්සේ ගැනත්, උන් වහන්සේගේ ප්‍රේමය හා කරුණාව ගැනත්, පව්වලට පසුතැවිලි වී උන් වහන්සේ වෙත හැරීමේ අවශ්‍යතාව ගැනත්, අනුන්ට දයාව දැක්වීම ගැනත්, කාටත් තේරුම් ගත හැකි බසින් කථා කළේය.
ඔහුගේ දේශනා වලට සවන් දුන් ජනයා මේ අමුත්තා ගැන විවිධ අදහස් පළ කරන්නට විය.
කවුද මේ පිස්සා..? මොලේ නරක් වෙලාද කොහේද... හරියට පඹයෙක් වගේ....
එහෙම කියන්න එපා... මට නම් හිතෙන්නෙ වෙන විදිහකට....
" ඒ මොකක්ද ඒ... මොනවද ඔබ ඒ ගැන හිතන්නේ ? "
ඔබ ඔහුට ඇහුම්කන් දුන්නාද? ඔහු කියන දෙයට..? එහි හරිම අලුත් බවක් තියෙනවා.....
ඒ කරුණු හැම දෙයක්ම අවංකවම ඔහු තමන්ගෙ හද පතුලෙන්ම කියන ඒවා.....
ප්‍රැන්සිස් පිස්සෙකු යැයි සිතා ඇතැම් කොලු කුරුට්ටන් ඔහුට විහිළු කළත්, හූ කිව්වත් ,ගල් ගැසුවත් ඔහු ඒ සියල්ලම ගණනකට නොගත්තා පමණක් නොව, ඔවුන් සමග සිනා සී, ඔවුන්ගේ විහිළු තහළුවලටද එක් වූයේය.